**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අන්තර්මධ්‍ය විභාගය - ජනවාරි 2014

## (54) ගිණුම්කරණය හා පාලන පද්ධති
(Accounting & Control Systems)

---

## A - කොටස
**බහුවරණ ප්‍රශ්න**

**ප්‍රශ්න අංක 01 - ලකුණු 30**
**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

(A) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වූ ආකෘතිමය රාමුව පිළිබඳව අනවබෝධය නිසා බොහෝ දෙනා නිවැරදි පිළිතුර වෙනුවට වෙනත් පිළිතුරු තෝරාගත් අවස්ථා බහුලව දක්නට ලැබිණ.

(B) බොහෝ දෙනා නිවැරදි පිළිතුර තෝරාගෙන තිබුණි.

(C) මෙහිදී ශේෂ පිරික්සුම පිළියෙල කිරීමෙන් අනාවරණය නොවන වැරදි සම්බන්ධයෙන් අසා තිබුණි. බොහෝ දෙනා නිවැරදි පිළිතුර තෝරාගෙන තිබීමෙන් මේ සම්බන්ධ දැනුම හොඳ තත්වයක ඇති බව පැහැදිලි වේ.

(D) ගණනය කිරීමෙන් නිවැරදි පිළිතුර සොයා ගත යුතු ප්‍රශ්නයකි. වැඩි දෙනෙක් අසාර්ථක වී තිබිණ. VAT ගණනය කිරීම පිළිබඳ අවබෝධය අඩු බව ඉන් පැහැදිලිය. විකුණුම් මත පමණක් (12/112 ලෙස) ගණනය කර වැරදි පිළිතුරු තෝරා ගත් අවස්ථා බහුලව දක්නට ලැබිණ.

(E) මෙහිදී තිබිය යුතු අවබෝධය වන්නේ ණයට ලබාගැනීම බැර කමක් බවත් ක්ෂය වියදමක් බවත්, වියදම් ස්කන්ධය අඩුවීමට බලපාන බවත් පමණි. මෙම දැනුම බොහෝ දෙනා තුල තිබූ බව නිවැරදි පිළිතුර තෝරා ගැනීමෙන් පැහැදිලි වේ.

(F) ගණනය කිරීමෙන් නිවැරදි පිළිතුර සොයා ගත යුතු ප්‍රශ්නයකි. නිවැරදි පිළිතුර තෝරාගැනීමට බොහෝ දෙනා අසමත් වී තිබිණ. බැංකු සැසඳුම් පිළිබඳ දැනුම දුර්වලවීම මීට හේතු වී ඇත.

(G) අවසන් තොග වැඩි වන තරමට ප්‍රවර්තන වර්ෂයේ ලාභය වැඩිවන බවත් ඊළඟ වර්ෂයේ ලාභය අඩුවන බවත් බොහෝ අපෙක්ෂකයන් හඳුනාගෙන නිවැරදි පිළිතුර තෝරා තිබුණි.

(H) සරල ප්‍රශ්නයකි. නිවැරදි පිළිතුර තේරීමට අවශ්‍ය වන්නේ උපචිත වියදම් මුදලින් ගෙවූ විට ජංගම වත්කම් මෙන්ම ජංගම බැරකම්ද අඩුවන බව වටහා ගැනීම පමණි. එම දැනුම බොහෝ දෙනා තුල තිබූ බව වැඩි දෙනා නිවැරදි පිළිතුර තෝරා ගෙන තිබීමෙන් පැහැදිලි වේ.

(I) ගණනය කිරීමෙන් නිවැරදි පිළිතුර සොයා ගත යුතු ප්‍රශ්නයකි. මෙහිදී නිවැරදි විකුණුම් වටිනාකම හා නිවැරදි දළ ලාභය ගණනය කිරීම මෙන්ම ප්‍රතිශත ගණනය කිරීමේ දැනුමද, එසේම තොග වටිනාකම සදොස් වීම ලාභය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ දැනුමද අවශ්‍ය වේ. මෙම දැනුම නොමැති වීමෙන් බොහෝ දෙනා අසීරුවට පත් වූ බව සදොස් පිළිතුරු තෝරා ගැනීමෙන් පැහැදිලි වේ.

(J) අවබෝධයෙන් නිවැරදි පිළිතුර සොයා ගත යුතු ප්‍රශ්නයකි. මෙහිදී තිබිය යුතු අවබෝධය වන්නේ ස්ථාවර වත්කම් ණයට මිලදී ගැනීම, ප්‍රධාන ජර්නලය හැරුනුවිට වෙනත් උපයෝගී පොතක් මගින් සටහන් තැබිය නොහැකි බව පමණි. එම දැනුම බොහෝ දෙනා තුල තිබූ බව සාර්ථක පිළිතුරු අනුව පැහැදිලි වේ.

(K) නිවැරදි පිළිතුර තෝරාගැනීමට බොහෝ දෙනා අසමත් වී තිබිණ. මෙහිදී අභ්‍යන්තර විගණක හා අභ්‍යන්තර විගණනය පිළිබඳ දැනුම දුර්වල වීම අසාර්ථක වීමට හේතු වී ඇත.

(L) මෙයද අවබෝධයෙන් නිවැරදි පිළිතුර සොයා ගත යුතු ප්‍රශ්නයකි. අභ්‍යන්තර පරීක්ෂාව පිළිබඳ දැනුමැති බොහෝ අය නිවැරදි පිළිතුර තෝරාගෙන තිබිණ.

(M) (N) & (O) වැඩි දෙනා සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

## B - කොටස

ප්‍රශ්න අංක **02** - ලකුණු 25
**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

(A) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත පෞද්ගලික සමාගමක් සංස්ථාපනය කිරීම සඳහා ඉදිරිපත් කළයුතු ලියවිලි සම්බන්ධයෙන් බොහෝ දෙනෙකුට නිසි අවබෝධයක් නොමැති බව නිරීක්ෂණය විය.

(B) කළමනාකරණයේ භාවිතය සඳහා ඉදිරිපත් කිරීමට සකස් කරනු ලබන ගිණුම් කට්ටලයක් පිළියෙල කිරීමේ හැකියාව මෙමගින් මැන බැලීමට අදහස්කර තිබූ අතර මේ සඳහා පිළිතුරු සැපයීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(1) බොහෝ අපේක්ෂකයින්ට අවසන් තොග ගිණුම් ගත කිරීමේදී පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගය ගිණුම් වල දැක්වීම පිළබඳ අවබෝධය අඩුමට්ටමක පැවති අතර බොහෝ දෙනෙකු පිරිවැය ගිණුම්වල දක්වා තිබුණි.

(2) 2013 මාර්තු 20 වන දින සිදුවූ රු.1,700,000/- වටිනා තොග සොරකම් කිරීම නිවැරදිව ගිණුම්ගත කිරීමට බොහෝ අපේක්ෂකයින්ට නොහැකිවී තිබූ අතර මෙම තොග සොරකම සිදුවී ඇත්තේ අවසන් තොගය ගණනය කිරීමට පෙර බව අවබෝධ කරගත නොහැකිව තිබුණි. මෙනිසා බොහෝ දෙනෙකු මෙම තොගයේ පිරිවැය අවසන් තොගයෙන් අඩුකර තිබුණි. තවද එකඟ වූ රක්ෂණ වන්දියෙන් ඇතිවූ අලාභය ලියාහැර ඉතිරිය පමණක් අලාභය ලෙස දැක්වීම වෙනුවට ලැබූ මුළු වන්දිය වෙනත් ආදායමක් ලෙස ගිණුම් ගතකල අවස්ථාද නිරීක්ෂණය විය.

(3) මෝටර් රථයක් ඉවත්කර නව මෝටර් රථයක් ලබාගැනීම සම්බන්ධයෙන් නිවැරදිව ගිණුම්ගත කිරීමට හැකිවී තිබුණේ අපේක්ෂකයින්ගෙන් කිහිප දෙනෙකුට පමණක් බව නිරීක්ෂණය විය. මෙහිදී ඉවත්කළ වාහනයේ පිරිවැය හා හුවමාරු වටිනාකම නිවැරදිව ගිණුම්ගත කර තිබුණද කාලයට අදාල සමුච්චිත ක්ෂය නිවැරදිව ගණනය කිරීමට නොහැකිවීම නිසා ලාභය නිවැරදිව ගණනය කිරීමට නොහැකිවී තිබුණි.

(4) ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ගැලපීමේදී මෝටර් වාහන හැරුණුවිට අනෙකුත් සියළුම වත්කම්වල ක්ෂයවීම් බොහෝ දෙනෙකු නිවැරදිව ගණනය කර තිබුණද මෝටර් වාහන සඳහා වර්ෂයට අදාල ක්ෂය හා සමුච්චිත ක්ෂය නිවැරදිව ගණනය කිරීමට අපොහොසත්වී තිබුණි.

(5) කාර්යාලය සඳහා ගෙවනලද කුලිය 2012 ජූලි 01 දින සිට 2013 ජූනි 30 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා යන්න තේරුම් ගැනීමට නොහැකිවීම නිසා 2013 අප්‍රේල් 01 සිට 2013 ජූනි 30 දින දක්වා වූ කාලයට අදාල රු.750,000/- ක මුදල ඉදිරියට ගෙවූ ගෙවල් කුලී ලෙස නොදක්වා මුළු මුදලම වර්ෂය තුළදී ලියාහැර තිබුණි.

(6) අපේක්ෂකයින්ගෙන් වැඩි ප්‍රමාණයකට ආදායම් බදු ගැලපීම නිවැරදිව සිදු කිරීමට නොහැකිවී තිබුණි. මෙහිදී 2011/2012 වර්ෂයට අදාල බද්ද රු. 4,350,000/- ලෙස නිගමනය කිරීමත් සමගම ඇතිවන රු.1,650,000/- ක අධි වෙන්කිරීම හා 2012/2013 වර්ෂයට අදාලව ඇස්තමේන්තු කරන ලද රු.8,500,000/- ක බද්ද ගිණුම්ගත කිරීමේදී ඇතැම් අය අධි වෙන්කිරීම හා ඇස්තමේන්තු බද්ද යන දෙකෙහිම එකතුව සඳහා වෙන් කිරීම් කර තිබූ අතර ඇතැම් අය අධි වෙන්කිරීම නොසලකා ප්‍රවර්තන වර්ෂයේ ඇස්තමේන්තුව පමණක් වෙන්කිරීම් ලෙස දක්වා තිබුණි. එමෙන්ම බොහෝ දෙනෙකු වර්ෂය සඳහා ගෙවියයුතු ආදායම් බදු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වීමේදී ශේෂ පිරික්සුමේ දක්වා ඇති ගෙවූ ආදායම් බදු මුදලවූ රු.8,370,000 න් පසුගිය වසරේ බදු මුදල අඩුකර (රු.4,350,000) ඉතිරිය ප්‍රවර්තන වර්ෂයේ වෙන් කිරීම සමග ගළපා ඉතිරිය පමණක් ජංගම වගකීම් ලෙස දැක්වීම සිදුකර නොතිබුණි.

(7) සමහර අපේක්ෂකයින් ණයකර පොළී ගෙවන දිනය පිළිබඳ නිසි අවධානයක් යොමු නොකිරීම නිසා මුළු මුදලම වර්ෂය තුළදී ගෙව්වා සේ සලකා ගිණුම් ගතකර තිබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 25**
**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

හවුල්කරුවකු වසර මැදදී විශ්‍රාම යාමේදී සිදුවන ගනුදෙනු ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් දැනුම මැනීම සඳහා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර තිබූ අතර මෙය අනිවාර්ය ප්‍රශ්නයක් බැවින් අපේක්ෂකයින්ගෙන් බොහෝ දෙනෙක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. මෙම ප්‍රශ්නය ඇගයීමට ලක් කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

<u>වෙළඳ ගිණුම පිළියෙල කිරීම</u>

1. වෙළඳ ගිණුම තීරු ක්‍රමයට පිළියෙල කිරීමට අවශ්‍ය තොරතුරු දී නොමැති අතර දළ ලාභය විකුණුම් පදනමට කාල පරිච්ඡේද 02 අතර බෙදීම අපේක්ෂිතය. එසේ වුවත් වෙළඳ ගිණුමද තීරු ක්‍රමයට කාල පරිච්ඡේද දෙක සඳහා පිළියෙල කර අසීරුවට පත් වූ අවස්ථා ද දක්නට ලැබිණ.

2. දළ ලාභය විකුණුම් පදනමට බෙදා දැක්වීම වෙනුවට කාල පදනමට බෙදා දැක්වූ පිළිතුරු පත් දක්නට ලැබිණ.

<u>ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම</u>

1. ගොඩනැගිලි ක්ෂය ගණනය කිරීමේදී ඉඩමේ වටිනාකම අත නොහැර ගණනය කල අවස්ථා විය.

2. හවුල් කරුවන්ගේ වැටුප් බොහෝවිට නිවැරදිව දක්වා තිබුනද, හවුල් කරුවන්ගේ ණය පොලී නිවැරදිව ගණනය නොකල අවස්ථා බහුලව දක්නට ලැබිණ. විශේෂයෙන් විශ්‍රාම ගිය හවුල් කරුගේ ණය මුදල නිවැරදිව ගණනය කිරීමටත්, ඒ අනුව පසු කාල පරිඡේදයට අදාල ඔහුගේ ණය පොලිය නිවැරදිව ගණනය කිරීමටත් අපොහොසත් වී ඇත.

3. ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී සිදුකල වැරදි නිසා කාල ඡේද දෙකටම අදාල ශුද්ධ ලාභය නිවැරදිව ගණනය නොවීමෙන් හවුල් කරුවන් වෙත නිවැරදිව ලාභ බෙදූ පිළිතුරු පත් දක්නට ලැබුනේ කිහිපයකි.

<u>ශේෂ පත්‍රය පිළියෙල කිරීම</u>

1. වාහන ක්ෂය නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ශේෂ පත්‍ර දිනට ඉතිරි වාහන වල අගය හා වාහන සමුච්චිත ක්ෂය නිවැරදිව දැක්වූ අවස්ථා දක්නට ලැබුනේ කිහිපයකි.

2. ලැබිය යුතු මුදල් වලින් කපාහල බොල් ණය අඩු නොකර මුළු ලැබිය යුතු මුදලම ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණු අවස්ථා විය.

3. විශ්‍රාම ගිය හවුල්කරු, දයාල් ගේ ණය මුදල සදොස්ව පෙන්වූ අවස්ථාද, ණය මුදල නොපෙන්වූ අවස්ථාද බහුලව දක්නට ලැබිණ. එසේම විශ්‍රාම ගිය හවුල්කරු, දයාල් ගේ ණය පොලී මුදලද සදොස්ව පෙන්වූ අවස්ථා බහුලව දක්නට ලැබිණ.

4. ශුද්ධ ලාභය, විශ්‍රාම ගිය හවුල්කරු දයාල් ගේ ණය මුදල, ණය පොලී මුදල්, හවුල් වේතන, හා කීර්ති නාමය ගැලපීම නිවැරදිව සිදු නොකිරීමත්, ප්‍රාග්ධන ගිණුමට හා ජංගම ගිණුමට නිවැරදිව නොගැනීමත් නිසා ශේෂ පත්‍රයේ පෙන්වූ ප්‍රාග්ධන ශේෂ හා ජංගම ගිණුම් ශේෂ බොහෝ අයගේ නිවැරදි නොවීය.

<u>ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම පිළියෙල කිරීම</u>

1. ප්‍රාග්ධන ගිණුමට යා යුතු ගණුදෙනු ජංගම ගිණුමේද, ජංගම ගිණුමට යා යුතු ගණුදෙනු ප්‍රාග්ධන ගිණුමේද, පෙන්වූ අවස්ථා දක්නට ලැබිණ. විශේෂයෙන් විශ්‍රාම ගිය හවුල්කරු, දයාල්ට පවරා දුන් වාහනයේ වටිනාකම (රු.800,000) සහ විශ්‍රාම යනවිට ගෙවූ මුදල (රු.900,000) ප්‍රාග්ධන ගිණුමට ගත යුතු වුවත් ජංගම ගිණුමට ගත් අවස්ථා ද විය.

2. ආදායම් ප්‍රකාශයෙන් ජංගම ගිණුමට මාරු කල දත්තයන් බොහෝ විට නිවැරදි නොවීය. (උදා: හවුල් වේතන, ලාභ කොටස් ආදිය)

3. ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම ශේෂ කිරීමේදී වැරදියට ශේෂ කල අවස්ථාද විය.

මේ හැරුණු විට දහස් ගණන් වලින් දත්ත දැක්වීමේදී සිදු කල දෝෂද දක්නට ලැබිණ.

## <u>C - කොටස</u>

**ප්‍රශ්න අංක 04 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

(A) වැටුප් පාලන ගිණුමක් නිවැරදිව පිළියෙල කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම මෙමගින් සිදු කෙරෙන අතර මේ සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය 06 කි. මෙය තෝරාගත හැකි ප්‍රශ්නයක් වුවද බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණ ද සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබාගත නොහැකිවී තිබුණි. මෙයට පහත හේතු බලපා තිබුණි.

(1) වැටුප් පාලන ගිණුමේ හර වියයුතු සටහන් බැර පැත්තේද බැර කළයුතු සටහන් හර පැත්තේද සටහන් කර තිබීම.

(2) පසුගිය මසයේ වැඩිපුර ගෙවූ වැටුප නිවැරදිව දක්වා නොතිබීම.

(3) ඇතැම් අපේක්ෂකයින් විසින් සේවක අර්ථසාධක අරමුදලට අදාල සේවායාගේ කොටසද වැටුප් පාලන ගිණුමට ඇතුළත් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(4) සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ දායකත්වයද වැටුප් පාලන ගිණුමේ දක්වා තිබූ අවස්ථාද නිරීක්ෂණය විය.

(B) මූලා ප්‍රකාශනයක ඇති දත්ත උපයෝගී කරගෙන විවිධ අනුපාත ගණනය කිරීම පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත. බොහෝ දෙනෙකු මෙම කොටසට සාර්ථකව පිළිතුරු සපයා තිබූ අතර ඇතැම් අය ජංගම වත්කම්, අනුපාත වශයෙන් නොතබා ප්‍රතිශත වශයෙන් දක්වා තිබූ අවස්ථාද නිරීක්ෂණය විය.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නය තෝරාගත් අයගේ පිළිතුරු පත් අනුව පහත සඳහන් දෑ දක්නට ලැබිණ.

1. අභ්‍යන්තර පාලනයේ සීමාවන් යනු කුමක්දැයි යන්න හරියට නොදැන සැපයූ පිළිතුරු විය.

2. පාලන පරිසරය වෙනුවට ව්‍යාපාර පරිසරය සැලකිල්ලට ගෙන ඇතම් අය පිළිතුරු සපයා තිබිණ.

3. තොග ආරක්ෂාව සඳහා වන හේතු අදාල කර ගනිමින් බොහෝ දෙනා නිවැරදිව පිළිතුරු සපයා තිබිණ.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

(A) බොහෝ අපේක්ෂකයින් අභ්‍යන්තර විගණකගේ ක්‍රියාකාරකම් හඳුනාගෙන නිවැරදිව පිළිතුරු සපයා තිබුණද ඇතැම් අපේක්ෂකයින් මූල්‍ය ප්‍රකාශනයක් සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීම අභ්‍යන්තර විගණකගේ ප්‍රධාන කාර්යක් ලෙස දක්වා තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(B) අපේක්ෂකයින්ගෙන් බෙහෝ දෙනා ප්‍රශ්නය නිවැරදිව හඳුනාගෙන පිළිතුරු සපයා තිබුණද ඇතැම් අය ගිණුම්කරණ පද්ධතියක කාර්යයන් වෙනුවට ගිණුම්කරණයේ ප්‍රයෝජන ඉදිරිපත් කර තිබුණි.

(C) බොහෝ අපේක්ෂකයින් මෙම ප්‍රශ්නය සඳහා සාර්ථකව පිළිතුරු සපයා තිබූ අතර ඇතැම් අපේක්ෂකයින් අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ විස්තර කර තිබුණි.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. ප්‍රශ්න පත්‍රයේ දී ඇති **"අයදුම්කරුවන්ට උපදෙස්"** නිවැරදිව කියවීම හා පිළිපැදීම.

2. සම්පූර්ණ විෂය නිර්දේශය හොඳින් අධ්‍යයනය කර තිබීම.

3. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

4. විෂය නිර්දේෂයට අදාල නව ගිණුම්කරණ ප්‍රමිත (LKASs සහ SLFRSs) පිළිබඳ දැනුවත් වීම.

5. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

6. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

7. සෑම ප්‍රශ්නයකටම අදාල පෙරවැඩ පැහැදිලිව පෙන්වා ඒවා පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතුය.

\- * * * -